(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 10(6).]

# පාර්ලිමේන්තුවේ අංක 10 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 මාර්තු මස 21 වැනි සිකුරාදා**

## 2014 අප්‍රේල් මස 08 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2014.03.18 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2014 ජනවාරි 20 දිනැති අංක 1846/10 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජනවාරි 20 දිනැති අංක 1846/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.03.18 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ රීති,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජනවාරි 20 දිනැති අංක 1846/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.03.18 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අංක 962 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 ජනවාරි 20 දිනැති අංක 1846/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.03.18 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 963 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ජාතික මංමාවත් පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව සහ 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 සහ 14 වැනි වගන්ති සමග කියවිය යුතු, එම පනතේ 89 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ, ගාස්තු ගෙවිය යුතු ජාතික මහාමාර්ග භාවිතා කරන සෑම වාහනයකම රියැදුරෙකුගෙන් අය කල යුතු ගාස්තු පිළිබඳව ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 ඔක්තෝබර් 17 දිනැති අංක 1832/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.03.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

විශේෂ වෙළඳ භාණ්ඩ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

මුදල් නීති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2014 අප්‍රේල් මස 22 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2439/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, නිල්වලා නිම්නය දෙපස පිහිටා ඇති කිරල කැලේ ප්‍රදේශයේ කුඹුරු විශාල ප්‍රමාණයක් පුරන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් වී හෝ වෙනත් බෝග වර්ග වගා කිරීම සඳහා සුදුසු පරිදි සකස් කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම කවරේද;

(iii) මේ වන විට එම බිම් අස්වැද්දීමට අදාළ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2469/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මේ දක්වා පවත්වා ඇති "දැයට කිරුළ" ප්‍රදර්ශන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ප්‍රදර්ශනය පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) එම එක් එක් ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල කවරේද;

(iv) අනාගතයේදී පැවැත්වීමට සැලසුම් කර ඇති දැයට කිරුළ ප්‍රදර්ශන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති "දැයට කිරුළ" ප්‍රදර්ශනය පැවැත්වූ දිනය කවරේද;

(ii) එය පැවැත්වූ ස්ථානය සහ එකී ප්‍රදර්ශන භූමිය සඳහා පවරාගත් ඉඩම් ප්‍රමාණය කවරේද;

(iii) එම ප්‍රදර්ශනය සඳහා වූ සමස්ත පිරිවැය සහ එක් එක් අමාත්‍යාංශය වෙනුවෙන් වැයකළ මුදල කොපමණද;

(iv) ඒ සඳහා ගනු ලැබූ ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැය කළ මුදල සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) එම භූමියේ දැනට ඉතිරිව ඇති ප්‍රාග්ධන භාණ්ඩ හෝ ගොඩනැගිලි කවරේද;

(vi) එම ප්‍රදර්ශනය සඳහා ගනු ලැබූ ඉහත සඳහන් ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැය කළ වියදම සාධාරණීකරණය කළ හැකිවන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2504/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා තිබෙන ජනකපුර විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනකපුර විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3264/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයට පෙනී සිටීම සඳහා 2012 අගෝස්තු මස 20 වැනි දින සිට ප්‍රවේශපත් නිකුත් කළ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවලින් නිකුත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂයේදී කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය වෙනුවෙන් නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව, එයට පෙනී සිටි සංඛ්‍යාව, සමත් වූ සංඛ්‍යාව සහ එම විභාග ප්‍රතිඵල මත කොරියානු රජයේ විදේශ රැකියා අවස්ථාවන් ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2011 වර්ෂයේ කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයේ අයදුම්පත් ලබා ගැනීමට විදේශ ගමන් බලපත්‍රය අනිවාර්ය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3367/'12

ගරු පී. හැරිසන් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයේ ලියාපදිංචි, ආරක්ෂක රැකවරණ ලබන ළමා නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සිටින ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් ළමයෙකුගේ නඩත්තු කටයුතු වෙනුවෙන් 2013 වර්ෂය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති ළමා රැඳවුම් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සිටින ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් ළමයෙකු වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම මුදල ඔවුන්ගේ නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ ) නොඑසේ නම්, ඒ මන්ද?

3699/'13

ගරු අනුර දිසානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් මෙට්‍රික් ටොන් එකක් ආනයනය කරන ලද සාමාන්‍ය මිල (CIF VALUE);

(ii) මෙට්‍රික් ටොන් එකක ආසන්න වශයෙන් අඩංගු පෙට්‍රල් ලීටර් සංඛ්‍යාව;

(iii) ඒ අනුව 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් ලීටරයක් වරායෙන් ගොඩබාන විට තිබූ සාමාන්‍ය මිල;

(iv) පෙට්‍රල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අය කරනු ලබන එක් එක් බදු ප්‍රමාණයන්;

(v) පෙට්‍රල් ලීටරයකින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබන ලාභය;

(vi) පෙට්‍රල් ලීටරයක් බෙදා හැරීමේ වියදම හා අලෙවි කිරීම මගින් පිරවුම් හල ලබන ලාභය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4074/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 හා 2013 වර්ෂවල අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවලදී සිදු වී ඇති අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරු හේතු කොට ගෙන ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එවැනි අනතුරු සිදුවීම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට හඳුනාගෙන ඇති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග පවතින ස්ථාන කවරේද;

(ii) ඒ ඒ ස්ථානවල අනතුරු අවම කිරීම සඳහා යෙදීමට බලාපොරොත්තු වන ආරක්ෂක වැඩපිළිවෙළ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ආරක්ෂක වැඩපිළිවෙළ සඳහා වැය වන මුදල ඇස්තමේන්තු කර තිබේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ දෙක තුළ සවිකර ඇති නව දුම්රිය ආරක්ෂිත ගේට්ටු සහ ආරක්ෂිත විදුලි සංඥා පද්ධති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා සවි කළ ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා දරන ලද වියදම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4219/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිවිල් මුල් අවස්ථා අධිකරණයන්හි ප්‍රමාදය අවම කිරීම පිණිස 2010, 2011, 2012 සහ 2013 යන එක් එක් වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශය විසින් ගන්නා ලද පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සිවිල් මුල් අවස්ථා අධිකරණයන්හි නඩු කටයුතු සැලකිය යුතු වේගයකින් සිදුවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4340/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, පැරණි සිලාවතුර තැපැල් කාර්යාලයෙහි බොහෝ අඩුපාඩු පවතින බවත්;

(ii) එම තැපැල් කාර්යාලය වැඩි දියුණු කළහොත් වර්තමානයේ එම ප්‍රදේශයේ පදිංචිව සිටින ජනතාවට ප්‍රයෝජනවත් වන බවත්;

(iii) දැනට එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට තැපැල් සේවාවන් ලබා ගැනීම සඳහා කිලෝමීටර් 17ක දුරින් පිහිටි මුරුංගන්හි තැපැල් කාර්යාලයට යාමට සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සිලාවතුර තැපැල් කාර්යාලයේ පවතින අඩුපාඩු සපුරාලීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4341/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් ලංකා බැංකුවේ, නිදහස් චතුරශ්‍ර ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 2323310 ට අමතරව එකී බැංකුවේම අංක 2323246 යටතේද ගිණුමක් පවත්වාගෙන ගිය බවත්;

(ii) 2005.04.15 වැනි දින එම ආයතනයේ අංක 4530801719 දරන සාමාන්‍ය බැංකු ගිණුමට එවන ලද රු.4,293,253.00ක මුදල 2005.05.03 වැනි දින අංක 004530207663 දරන වෙනත් ගිණුමකට මාරු කිරීමට එම ආයතනයේ මුදල් කළමනාකරු හා විධායක අධ්‍යක්ෂවරයා නියෝග කළ බවත්;

(iii) එම අතිරේක ගිණුම පිළිබඳ තොරතුරු ඉහත ආයතනය සතුව නොතිබූ බැවින් එම මුදල් කුමන කාර්යයක් සඳහා භාවිතා කළේද යන්න විගණනයේදී හෙළිදරව්වී නොමැති බවත්;

(iv) ඉහත (i)හි සඳහන් අංක 2323246 දරන ගිණුම පිළිබඳව ද කිසිම තොරතුරක් එම ආයතනය සතුව නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගිණුම් අංක 2323310ට අමතරව අංක 2323246 යටතේ තවත් ගිණුමක් පවත්වාගෙන යෑමට හේතුව කවරේද;

(ii) ඉහත අ(i) සහ අ(ii)හි සඳහන් ගිණුම් අංක ඔස්සේ අයථා මුදල් ගණුදෙනු සිදු කළ දූෂිත නිලධාරීන් කවුරුන්ද:

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4407/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන කර්මාන්තකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඇඟළුම් කර්මාන්තශාලාවල සේවය කරනු ලබන සේවක සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඇඟළුම් කර්මාන්තශාලාවල මේ වන විට 30,000ක පමණ සේවක සේවිකා පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඇඟළුම් කර්මාන්තශාලාවල පවතින පුරප්පාඩු මේ දක්වා පුරවනු ලැබුවේ දේශීය ශ්‍රමිකයන් යොදවාගෙන බව පිළිගන්නේද;

(ii) ඉදිරියේදී එම පුරප්පාඩු පිරවීම සඳහා බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය වැනි රටවලින් විදේශ ශ්‍රමය ගෙන්වා ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතින්නේද;

(iii) එසේ නම්, එවැනි තත්ත්වයක් ඇතිවීමට බලපෑ හේතු සාධක කවරේද;

(iv) ඒ ආකාරයෙන් ඇඟළුම් ක්ෂේත්‍රයේ පුරප්පාඩු පිරවීම සඳහා විදේශ ශ්‍රමිකයන් යොදවා ගැනීම තුළින් මෙරට තරුණ තරුණියන්ට තිබූ රැකියා අවස්ථා අහිමිවීමක් සිදුවන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4629/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර නව නගර සීමාව තුළ බලංගොඩ වැව්ලි සමාගම යටතේ පවතින ඉඩම් යම් ප්‍රමාණයක්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් අඩු ආදායම්ලාභීන්ට සහ රාජ්‍ය සේවකයින්ට බෙදා දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට වෙන් කර දී තිබේද;

(ii) එසේ නම්, එම මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) බෙදා දීමට නියමිත ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ බෙදා වෙන් කිරීමට යෝජිත ඉඩම් පර්චසයක තක්සේරු වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඉඩම් කොටස් බෙදා දීමට යෝජිත එක් එක් රාජ්‍ය සේවකයාගේ නම, ඔහු හෝ ඇය අවසාන වරට දරන ලද තනතුර සහ ලැබීමට නියමිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත ඉඩම්ලාභීන් අතර සිටින එක් එක් අඩු ආදායම්ලාභියාගේ නම, මාසික ආදායම සහ ලැබීමට නියමිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) යෝජිත ඉඩම්ලාභීන් විසින් මුදල් ගෙවීම් කර ඇත්නම්, එම මුදල් ගෙවූ ගිණුම සහ එම ගිණුමේ අංකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2507/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා තිබෙන ඇතාවැටුනවැව විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත් ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඇතාවැටුනවැව විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2684/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) "දැයට කිරුළ" ප්‍රදර්ශනයෙහි සංකල්පය එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා පැවැත්වූ එක් එක් දැයට කිරුළ ප්‍රදර්ශනයෙන් ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැකියාවන් කවරේද;

(iii) ඒවා ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත රැකියාද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුරයෙහි පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සත්‍ය වශයෙන්ම මුදල් වැය කළ වැය ශීර්ෂය කවරේද;

(ii) අවසන් වරට පැවැත්වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා කිසිදු ගෙවීමකින් තොරව ලබා ගත් ඇතැම් වත්කම් සහ ශ්‍රමය, එනම් සන්නද්ධ හමුදාවන්හි පුද්ගලයන් හෝ ශ්‍රමය සහ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයෙහි බස්රථ වැනි දෑ සම්පූර්ණ පිරිවැය ගණනය කිරීමේදී පිරිවැය සංරචකයන්හි ඇතුළත් කොට තිබේද;

(iii) එසේ නොමැති නම්, ඉහත කී ප්‍රදර්ශනය සඳහා මුළු පිරිවැය ගණනය කළ ආකාරය කවරේද;

(iv) පැවැත්වීමට නියමිත මීළඟ දැයට කිරුළ ප්‍රදර්ශන තුන සඳහා අපේක්ෂිත පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3013/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) හ/තංගල්ල පිරිමි ජාතික පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු 2007 අප්‍රේල් මස 4 වැනි දින තංගල්ල බස් නැවතුම්පොළේ සිට ඔහුගේ නිවසට රැගෙන යන අතරමගදී තංගල්ල එවකට හිටපු නගරාධිපතිවරයා විසින් බලවත් ලෙස අපයෝජනයට ලක්කර ඇති බවත්;

(ii) ඒ පිළිබඳව තංගල්ල පිරිමි ජාතික පාසලේ ශිෂ්‍ය උපදේශක ගුරු මහතාට දැන්වීමෙන් පසු තංගල්ල පොලිසියට පැමිණිලි කර ඇති බවත්;

(iii) එම පැමිණිල්ල ඉහත පොලිස් ස්ථානයේ පැමිණිලි අංක C.W.I.B 127 පිටුව 24 වැනි ඡේදයෙහි සටහන් කර ඇති බවත්;

(iv) එම පැමිණිල්ල අනුව එම නගරාධිපතිවරයාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන මෙන් තංගල්ල නගරයේ විශ්‍රාමික පුරවැසි සංගමය ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත පැමිණිල්ල පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2014 අප්‍රේල් මස 23 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2562/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ විවිධ පළාත් පාලන ආයතනවල කටයුතු කරන මහජන නියෝජිතයන් හට ලැබෙන මාසික වේතනයන් කොපමණද;

(ii) එම නියෝජිතයින්ට ප්‍රමාණවත් වේතනයන් ලැබෙන්නේද;

(iii) පළාත් පාලන ආයතනවල කටයුතු කරන මහජන නියෝජිතයින්ට ජනතා සේවාවන් ඉටුකිරීම සඳහා ලබා දෙන පහසුකම් හා දීමනා කවරේද;

(iv) ප්‍රශස්ත ජනතා සේවාවක් ඉටුකිරීමට එම දීමනා හා පහසුකම් ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2787/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කරන ලද දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාව දීම කොන්දේසි සහිත සමාව දීමක්ද; නැතහොත් කොන්දේසි විරහිත සමාව දීමක්ද යන්නත්;

(ii) ෆොන්සේකා මහතාගේ විශ්‍රාමික අයිතිවාසිකම් සහ හමුදා නිල නැවත ලබා දෙන ලද්දේද යන්නත්;

(iii) තවමත් එතුමාව "ජෙනරාල්" යන පදවි නාමයෙන් හැඳින්විය හැකිද යන්නත්;

(iv) ෆොන්සේකා මහතාට එරෙහිව උසාවියේ තවත් පොරොත්තු නඩු තිබේද යන්නත්;

(v) ජනාධිපති සමාව නිසා විභාගවීමට නියමිත එම නඩු අහෝසි වන්නේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සරත් ෆොන්සේකා මහතා සමග කටයුතු කිරීම හෝ එතුමාට සහාය දීම නිසා පීඩාවට හෙළන ලද හෝ සේවය අවසන් කිරීමට ලක්වූ පොලිසියේ හෝ හමුදාවේ හටයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම හෝ වන්දි ලබා දීම සිදුකර තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කිරීමේ කරුණට අදාළව,

(i) ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වූ පුද්ගලයින් කවුරුන්ද යන්නත්;

(ii) ඒ සම්බන්ධයෙන් බලපෑම් ඇති කළ රටවල් සහ එය සිදු වූයේ කවර අවස්ථාවක ද යන්නත්;

(iii) දේශපාලන සහ ආගමික නායකයින්ගේ මැදිහත්වීම් නොසලකා හැරියේ මන්ද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3083/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල සීමාව තුළ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ ඉහළ යෑමට සමානුපාතිකව මිල ඉහළ ගොස් ඇති දුම්වැටි (සිගරට්) වර්ගවල නම් කවරේද;

(ii) එලෙස මිල ඉහළ ගොස් නොමැති සිගරට් වර්ග තිබේ නම්, ඒවා කවරේද;

(iii) 2012 මාර්තු මාසයේදී ඩන්හිල් වර්ගයේ දුම්වැටියක මිල ඉහළ ගිය ප්‍රමාණය කොපමණද;

(iv) එහි ප්‍රතිඵලයක් ලෙස එක් දුම්වැටියක් විකිණීමෙන් රජයට සහ දුම්කොළ සමාගමට ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ශ්‍රී ලංකාවේ අලෙවිකළ මුළු සිගරට් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත අගයන්ට අනුව සිගරට් අලෙවියේ වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3268/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම "සේවා පියස" කාර්යාලය බැගින් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) "සේවා පියස" එක් කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(iv) "සේවා පියස" පළමු කාර්යාලය ඉදිකරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3379/'12

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) උතුරු මැද පළාත් සභාව මගින් පාලනය කරනු ලබන රෝහල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් රෝහල සඳහා අනුමත වෛද්‍යවරු, හෙදියන්, රෝහල් කම්කරුවන් හා අනෙකුත් අනුමත කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල් අතරින් අනුමත කාර්ය මණ්ඩලයේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් රෝහල අනුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාත් සභාව මගින් 2012 වර්ෂය සඳහා එම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදලින් රෝහල්වල සිදුකළ සේවාවන් කවරේද;

(iii) 2012 වර්ෂයේදී උතුරු මැද පළාතේ එක් එක් රෝහල වෙතින් ප්‍රතිකාර ලබා ගෙන ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) සමස්තයක් වශයෙන් එම වර්ෂය තුළ ප්‍රතිකාර ලබාගත් එක් රෝගියෙක් සඳහා උතුරු මැද පළාත් සභාවෙන් වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3654/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල්, නවෝදයා පාසල් හා ප්‍රාථමික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල සිටින ශිෂ්‍ය සංඛ්‍යාව හා එක් එක් විෂයය අනුව ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පාසල්වල ගුරු හිඟයක් තිබේද;

(iv) එසේ නම්, ගුරු හිඟයක් ඇති පාසල්වල නම් සහ ගුරු හිඟය පවතින විෂයයන් කවරේද;

(v) එම ප්‍රදේශයේ ගුරු හිඟයක් පවතී නම්, එය විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අම්පාර දිස්ත්‍රික්කයේ ඉහත (අ) (i) හි සඳහන් පාසල් අතරින් පුස්තකාල පහසුකම්, ජල පහසුකම් හා සනීපාරක්ෂක (වැසිකිලි) පහසුකම් නොමැති පාසල් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3943/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ පත්කොට ඇති ජනාධිපති කොමිෂන් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොමිෂන් සභා කවරේද;

(iii) එම එක් එක් කොමිෂන් සභාව සඳහා වැය කර ඇති මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත එක් එක් කොමිෂන් සභාව,

(i) සැදුම්ලත් සාමාජිකයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ සුදුසුකම් කවරේද;

(ii) පත් කිරීමේ අරමුණු කවරේද;

(iii) තම වාර්තා ඉදිරිපත් කර තිබේද;

(iv) එම වාර්තා සභාගත කරන්නේද;

(v) එම වාර්තා මගින් ලබා දී ඇති නිර්දේශයන් ක්‍රියාත්මකකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4109/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් e - NIC ව්‍යාපෘතිය වෙනුවෙන් ලංකා ලොජිස්ටික් සමාගමට එක් එක් අවස්ථාවේදී ගෙවා ඇති මුදල් ප්‍රමාණයන් කොපමණද;

(ii) එම ගෙවීම් සිදුකරන ලද දිනයන් කවරේද;

(iii) ඉහත කී ව්‍යාපෘතිය වෙනුවෙන් 2012.12.31 දින ලංකා ලොජිස්ටික් සමාගම විසින් රු. 37,649,044.00ක මුදලක් ඉල්ලා තිබේද;

(iv) එකී මුදල් ප්‍රමාණය ඉහත සමාගම වෙත ගෙවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලංකා ලොජිස්ටික් සමාගම විසින් e - NIC ව්‍යාපෘතියට අදාළව ලබාදී ඇති සේවාවන් සහ එම එක් එක් සේවාවට අදාළ වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) e - NIC ව්‍යාපෘතියේ සියලු කටයුතු සඳහා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට නියමිතව තිබියදී, අතරමැදි ආයතනයකට විශාල මුදලක් ගෙවීමට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4408/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ හා ස්වේච්ඡා සංවිධාන මගින් පාලනය වන ළමා නිවාසවල වාසය කරන දරුවන් එම ළමා නිවාසවලින් පිටමං කර සමාජගත කිරීම සිදුකරනු ලබන වයස් සීමාව කවරේද;

(ii) එම වයස් සීමාවට එළැඹෙන තෙක් ළමා නිවාස තුළ දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) ළමා නිවාසවලින් පිටමං කරන දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) ඔවුන් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් මත කිසියම් රැකියා අවස්ථාවක් ලබා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4411/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් අත්පත් කරගන්නා ලද ලංකා එනර්ජි පුද්ගලික සමාගමට අයත් කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් මේ වන විට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘති කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිමකිරීමට ගතවන කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මෙතෙක් වැඩ කටයුතු ආරම්භ කර නොමැති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරියේදී ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2565/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සංචාරක පුරවරයක් වන අලුත්ගම නගරයේ පුළුල් මාර්ග පද්ධතියට සරිලන පරිදි ක්‍රමවත්ව සකසා නොමැති කාණු පද්ධතියේ අපද්‍රව්‍ය රැඳී අවහිරවීම නගරය පුරා දුර්ගන්ධයක් පැතිරයාමට හේතුවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගනු ලබන්නේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) අලුත්ගම නගරයේ ඉදිකළ නව බස් නැවතුම්පළෙහි කඩ සාප්පු මේ වනතෙක් වෙළෙඳුන්ට ලබා නොදීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3156/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ කාර්යභාරය කවරේද;

(ii) කොළඹ කොටස් හුවමාරුවේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ හිටපු සභාපතිවරුන් වන ඉන්ද්‍රානි සුගතදාස මහත්මිය සහ තිලක් කරුණාරත්න මහතා විසින් හෙළි කරන ලද, 2011 සහ 2012 වර්ෂවලදී කොටස් වෙළඳ පොළ මෙහෙයුම්වලට අදාළව සිදු වූ බවට වාර්තා වූ "මාෆියා" ක්‍රියාකාරකම් පිළිබඳව විමර්ශන සිදු කර තිබේද;

(ii) එම විමර්ශනවල වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාමාර්ග නොගැනීමට හේතු කවරේද;

(iv) ක්‍රියාමාර්ග ගෙන සමථයකට පත් කරන ලද සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම බේරුම් කිරීම්වල පිරිවැය කවරේද;

(vi) එම බේරුම් කිරීම් දේශපාලන බලපෑම් මත සිදු වූ ඒවාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3293/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ට සිදුවන හිරිහැර පිළිබඳව සොයා බැලීම සඳහා 2008 ජුනි මාසයේදී යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ කාමර අංක 2/08 හිදී ඇමති අනුකමිටුවක් පිහිටුවනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම අනුකමිටුව අහෝසි කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ඇමති අනුකමිටුවේ කටයුතු පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලේ කුලිය, දුරකථන බිල්පත් සහ විදුලි බිල්පත් සඳහා වැය කරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් වියදම්වලට අමතරව දරන ලද වෙනත් වියදම් සඳහා වැය වූ මුළු මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම වියදම් සිදුකරන ලද අමාත්‍යාංශ සහ ඊට අදාළ වැය ශීර්ෂයන් කවරේද;

(ii) ඉහත සඳහන් ගෙවීම් මෙතෙක් සිදුකර නොමැති නම්, එම ගෙවීම් සිදුකරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3383/’12

ගරු පී. හැරිසන් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකාව තුළ ඇති කිරීමට අපේක්ෂිත ස්වභාවික වන අලි සංරක්ෂණ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එක් එක් මධ්‍යස්ථානයේ,

(i) නම, පිහිටීම, විශාලත්වය සහ ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) අපේක්ෂිත කාර්ය භාරය කවරේද;

(iii) ඉදිකරනු ලබන විදුලි වැටවල්වල දුර ප්‍රමාණය හා ඒවා ඉදිකිරීම සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විදුලි වැටවල් නඩත්තුව සඳහා යෙදවීමට අපේක්ෂිත නිලධාරීන් සංඛ්‍යාව සහ ඒ සඳහා වැයවන මුදල කොපමණද;

(v) එක් මධ්‍යස්ථානයක සේවයේ යොදවනු ලබන මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) හොරොව්පතාන වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානය තුළ,

(i) ඉදිකිරීමට නියමිත වැව් සංඛ්‍යාව හා ඒවා සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) ඉදිකරන තණ පිට්ටනි සංඛ්‍යාව සහ ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) අලි පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂිත කාලය කොපමණද;

(iv) පුනරුත්ථාපනය කරනු ලබන එම අලි මුදාහරින ප්‍රදේශ කවරේද;

(v) පුනරුත්ථාපනය කර මුදාහරින ලද අලි සම්බන්ධයෙන් පසු විපරමක් කරනු ලබන්නේ නම්, එය සිදු කරන ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3908/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල නගරයට යාබද දඬුගම ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සත්ව ගාල් සංඛ්‍යාව සහ සත්ව ඝාතකාගාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රදේශයේ නිරන්තරව එකතු වන ජීව අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වැඩපිළිවෙළ කවරේද;

(iii) එම අපද්‍රව්‍යවලට අදාළව යම් පාරිසරික හා සෞඛ්‍ය සංරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මකවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 අප්‍රේල් මස 24 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2569/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේ දී අති විශේෂ ගැසට් නිවේදනයකින් රක්ෂිත ප්‍රදේශයක් බවට ප්‍රකාශිත බුලත්සිංහල, වගුරාන වනාන්තරය විනාශයට පත්වෙමින් පවතින බවත්;

(ii) ඉතා දුර්ලභ ශාක හා සත්ව සම්පත්වලින් අනූන මෙම වනාන්තරය රැක ගැනීමට ආරක්ෂක නිලධාරීන් යොදවා නොමැති බවත්;

(iii) එම වනාන්තරය නැරඹීමට එන අය සඳහා තොරතුරු සැපයීමේ වැඩපිළිවෙළක් නොමැති බවත්;

(iv) බටපොත ඇල ඔස්සේ වගුරාන වනාන්තරයට කැළිකසළ ගලා ඒම වැළැක්වීමට වැඩපිළිවෙළක් සලසා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් සංවේදී පරිසර කලාපයට ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගේ සේවය කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3113/'12

ගරු රවි කරුණානායක මහතා,— ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) 2010 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දේශපාලනඥයින් සහ දේශපාලන සම්බන්ධකම් සහිත නිලධාරීන් විසින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සමහර ඉඩම් බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම් අතරින් 2010 වර්ෂයේ සිට හිමිකම් පවරාදෙන ලද, කල්බදු දෙන ලද සහ බලපත්‍ර හෝ "ස්වර්ණභූමි" ඔප්පු මත අන්සතු කරන ලද රජයේ ඉඩම්වල නම්, අක්කර ගණන සහ වටිනාකම එක් එක් ඉඩම අනුව කවරේද;

(ii) එකී ඉඩම් නිසි ටෙන්ඩර් පටිපාටීන් අනුගමනය නොකරමින් එසේ පවරාදීමට හෝ භාරදීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) යටතේ සඳහන්කර ඇති ප්‍රදේශයේ දශක ගණනාවක් පදිංචිව සිටි ජනතාවට සහ අනෙකුත් අයට එකී ආකාරයට ඉඩම් ලබාගැනීමේ අවස්ථා සහ පහසුකම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදී ග්‍රහණයේ පැවති ඉඩම් නිදහස් කරගන්නා මුවාවෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි වෙරළ බඩ ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ගෙන් බලහත්කාරයෙන් හෝ තර්ජනය කර පවරාගන්නා බවට එල්ලවී ඇති චෝදනාවන්ට සත්‍ය කරුණු පදනම්වී තිබේද;

(ii) නොඑසේ නම්, එවන් චෝදනා එල්ල වීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3255/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාත්‍යන්තර නැව් මාර්ගයට මුහුණලා ඉදිකර ඇති ගාල්ල, රුමස්සල ජපන් සාම චෛත්‍යය ආසන්නයේ ස්වර්ණභූමි ඔප්පු යටතේ ලබා දී ඇති ඉඩම් ව්‍යාපාරිකයන් විසින් මිලදී ගෙන ඒවායේ නිවාස සාදන මුවාවෙන් හෝටල් සංකීර්ණ සඳහා මහල් ගොඩනැගිලි සාදන බවත්;

(ii) ඥාති සම්බන්ධතා නොමැති අයෙකුට විකිණීමට හෝ පැවරීමට නොහැකි ස්වර්ණභූමි ඔප්පු සහිත එම ඉඩම් ව්‍යාපාරිකයන්ට විකිණීම සඳහා රජයේ නිලධාරීන් ද සම්බන්ධ බවට ප්‍රදේශවාසීන් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් විකිණීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කරන්නේද;

(ii) සාම චෛත්‍යයේ පැවැත්මට දැඩි බලපෑම් ඇතිවන පරිදි කරනු ලබන ඉහත සඳහන් ඉඩම්වල හෝටල් ඉදිකිරීම නවතා දැමීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3610/'13

ගරු පී. හැරිසන් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මරදන්කඩවල සිට පහළ අඹතලේ හරහා මුරියාකඩවල මාර්ගයේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කරනු ලැබූ දිනය කවරේද;

(ii) එම මාර්ගයේ දුර හා අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම මාර්ගයේ අලුත්වැඩියා කටයුතු කරනු ලබන කොන්ත්‍රාත් සමාගමේ නම හා එහි හිමිකරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ වැඩ අවසන් කළ යුතුව තිබූ ගිවිසුම්ගත දිනය කවරේද;

(ii) එම කාල සීමාව තුළ දී ඉහත මාර්ගයේ වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකි වූයේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඉහත සඳහන් කොන්ත්‍රාත් සමාගම අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ වෙනත් මාර්ග ඉදිකිරීම් කටයුතු භාරගෙන තිබේද;

(iv) එසේ නම්, එම එක් එක් මාර්ගයේ නම සහ ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම මාර්ග ඉදිකිරීම් අවසන් කිරීමේදී ද ඉහත පරිදි නියමිත කාල සීමාව ඉක්මවා කල්ගත කොට තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කොන්ත්‍රාත් සමාගමට මාර්ග සංවර්ධන ඉදිකිරීම් කටයුතු නිසියාකාරව කිරීමට නොහැකි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එවැනි කොන්ත්‍රාත් සමාගමක් සම්බන්ධයෙන් ඉදිරියේ දී ගනු ලබන පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3733/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සවුදි අරාබියේදී ගෙල සිදීමේ දඬුවමට හසුව මියගිය මුත්තුර්හි, බාලවයස්කාර රිසානා නාෆික් නමැති පාසල් ශිෂ්‍යාව රවටා ව්‍යාජ ගුවන් ගමන් බලපත්‍ර ඇතුළු ලියකියවිලි සාදා විදේශගත කිරීමේ වරද හේතුවෙන් ලියාපදිංචිය අහෝසිකළ "ඔමාර් ට්‍රැවල්ස්" නමැති රැකියා ඒජන්සිය නැවත "ඔමල්කා ට්‍රැවල්ස්" යන නාමයෙන් ලියාපදිංචි වී ඇති බව දන්නේද;

(ii) අසාධු ලේඛනගතවූ "ඔමාර් ට්‍රැවල්ස්" ඒජන්සිය එම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ම වෙනත් නමකින් ලියාපදිංචි කිරීමට අවසරදීමට හේතු කවරේද;

(iii) එවැනි අවසරදීමක් සිදුකිරීම හේතුවෙන් කූට ඒජන්සිකරුවන් තව තවත් අපරාධවලට පෙළඹෙන බවත්, ව්‍යාජ ලිපිලේඛන සෑදීමට බිය නොවන බවත් පිළිගන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4092/'13

ගරු අනුර දිසානායක මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් ඒ යටතේ පුහුණුවන සිසුන් වෙනුවෙන් 2013 වර්ෂයේදී කොළඹ දී පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩමුළු පවත්වන ලද දිනයන් හා එක් එක් වැඩමුළුව සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව කවරේද;

(iii) එම වැඩමුළුවල පරමාර්ථ කවරේද;

(iv) එම වැඩමුළුවලට සහභාගී වූ දේශකයින් කවුරුන්ද:

(v) එම එක් එක් වැඩමුළුව වෙනුවෙන් ප්‍රවාහන, ආහාර, දේශන ගාස්තු ඇතුලුව සිදුකළ සමස්ත වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4106/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රජය මගින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව යටතේ ඉදිරිපත් කර ඇති "ජාතික භෞතික සැලැස්ම" පිළිබඳ දැනුවත් වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සැලැස්මට අනුව,

(i) භාවිතයට ගැනීමට නියමිත වනාන්තර බිම් ප්‍රමාණය කොපමණද;

(ii) වනාන්තර මැදින් මහා මාර්ග ඉදිකිරීමට නියමිත ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(iii) වනාන්තර මැද සංචාරක කළාප ඉදිවන ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4292/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මුහුදු කලාපය තුළ සිටින නිල් තල්මසුන් (Blue Whales) පිළිබඳව විද්‍යාත්මක ගවේෂණයක් ශ්‍රී ලංකා රජය විසින් හෝ රජයේ අනුග්‍රහය සහිතව පෞද්ගලික අංශය විසින් හෝ සිදුකර තිබේද;

(ii) එවැනි ගවේෂණයක් සිදුකර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ මිරිස්සට ඔබ්බෙන් වූ මුහුදු ප්‍රදේශය නිල් තල්මසුන් විශාල වශයෙන් ජීවත්වන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති බවත්;

(ii) එම නිල් තල්මසුන්ගේ පැවැත්මට මිරිස්ස මුහුදු ප්‍රදේශය හරහා පවතින ජාත්‍යන්තර මුහුදු මාර්ගයේ ගමන්කරන නෞකාවලින් බරපතල හානියක් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) නිල් තල්මසුන්ගේ පැවැත්මට ඉහත ආ(ii) හි සඳහන් පරිදි සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4307/'13

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තාවී ඇති ඩෙංගු රෝගීන් සංඛ්‍යාව, වාර්ෂික පදනමින් කොපමණද;

(ii) 2011 වර්ෂයේ සිට මේ දක්වා ඩෙංගු රෝගය හේතුවෙන් සිදුවූ බවට වාර්තාවී ඇති මරණ සංඛ්‍යාව, වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2009 ජනවාරි මස සිට මේ දක්වා,

(i) හඳුනාගත් ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන ලෙස හඳුනාගත් පාසල්, විශ්වවිද්‍යාල හා රාජ්‍ය ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2010 ජනවාරි මස සිට මේ දක්වා වාර්ෂික පදනමින්,

(i) ශ්‍රී ලංකාවේ ඉහළම ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වූ දිස්ත්‍රික්ක තුන කවරේද;

(ii) එම එක් එක් දිස්ත්‍රික්කය තුළ හඳුනාගත් මදුරුවන් බෝවන ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ඩෙංගු වසංගතයට පිළියම් යෙදීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කරන ලද කමිටු කවරේද;

(ii) එම එක් එක් කමිටුව පත් කළ දිනය කවරේද;

(iii) එම එක් එක් කමිටුවේ බලපැවරුම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4317/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිරිවෙන් අධ්‍යාපන ආයතන සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේදී සලකා බලනු ලබන මූලික අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම ආයතන සඳහා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාවේ හිඟයක් තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයේ වර්තමාන අධ්‍යක්ෂවරයා කවුරුන්ද;

(ii) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) එම අධ්‍යක්ෂවරයා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධාරියෙක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4439/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ මේ වන විට,

(i) වර්ෂ 20 ක සේවා කාලයක් හා වර්ෂ 10 ක සේවා කාලයක් සපුරා ඇති පොලිස් කොස්තාපල්වරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පොලිස් සැරයන්වරයෙකු ලෙස වර්ෂ 10 ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i) හා (ii) හි සඳහන් පොලිස් නිලධාරීන් උසස්වීම් ලැබීම සඳහා සුදුසුකම් ලබා තිබේද;

(iv) සුදුසුකම් ලත් අය අතරින් අදාළ උසස්වීම් ලබාදීමට අපේක්ෂිත සංඛ්‍යාව කොපමණද;

(v) සුදුසුකම් ලබා තිබියදීත්, උසස්වීම් නොලැබුනු පොලිස් නිලධාරීන්ට නියමිත උසස්වීම් ලබාදීම ප්‍රමාදවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4554/'13

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇතත්, ස්ථිර පත්වීම් ලබා දී නොමැති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට මේ දක්වා ස්ථිර පත්වීම් ලබා නොදීමට හේතු කවරේද;

(iii) ස්ථිර පත්වීම් ලබා නොදීම හේතුවෙන් එම ගුරුවරුන්ට හිමි වරප්‍රසාද අහිමි වී ගොස් ඇති බව පිළිගන්නේද;

(iv) එම ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලිපි ලබාදීමට අපේක්ෂා කරනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2571/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පළමුවැනි පාර්ලිමේන්තුවේ සිට හත්වැනි පාර්ලිමේන්තුව දක්වා එක් එක් පාර්ලිමේන්තුවේ සිටි කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍ය මණ්ඩලයන්හි සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් අමාත්‍ය මණ්ඩලයන්හි සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව අදාළ අමාත්‍ය මණ්ඩලයේ සිටි මුළු අමාත්‍යධුර සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රටේ වර්තමාන කාන්තා ජනගහණයේ ප්‍රතිශතයට සරිලන සාධාරණ නියෝජනයක් අමාත්‍ය මණ්ඩල තුළ කාන්තාවන්ට ලැබී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3146/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 ජනවාරි මස 01 වැනිදා සිට අද දක්වා ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ලැබුණු ආධාර, සහනදායී ණය සහ ප්‍රදාන ප්‍රමාණයන් වාර්ෂික පදනමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මුදල් ලබා දී තිබූ වර්ෂයක් සඳහා සියල්ල ඇතුළත් වැඩිම සහ අඩුම පොලී පිරිවැය කවරේද;

(iii) එක් එක් මුදල් ලබා දීම සඳහා ආපසු ගෙවීමේ කාල සීමාව කවරේද;

(iv) එකී මුදල් උපයෝගී කර ගනු ලැබූ එක් එක් ව්‍යාපෘතියෙන් උපයා ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය කවරේද;

(v) ණය මුදල ලබා දී තිබූ දිනයේ සිට වර්ෂ 5ක් සඳහා එක් එක් ණය මුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3396/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වයස අවුරුදු 65 ඉක්මවූ, 1980 ජූලි වර්ජකයින්ට රුපියල් 5000.00 ක දීමනාවක් ලබා දෙන බවට 2013 අය - වැය යෝජනා ඉදිරිපත් කරමින් ජනාධිපතිවරයා ප්‍රකාශ කළ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) වර්ෂ 32 කට අධික කාලයක සිට, 1980 ජූලි වර්ජකයින්ගේ දරු පවුල් දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ජීවත්වන බවත්;

(ii) එම වර්ජකයින්ගෙන් වැඩි පිරිසක් මේ වන විට මිය ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් දීමනාව ලබාදීමට යෝජිත වයස් සීමාව අවුරුදු 65 සිට 55 දක්වා අඩුකර එම පවුල්වලට සහන සැලසීමටත්;

(ii) මියගොස් ඇති ජූලි වර්ජකයෙකුගේ බිරිඳට හෝ දරුවෙකුට එම දීමනාව ලබා දීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2584/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විදුලිය නොමැති ගම්මානවලට කවර කාල සීමාවක් තුළ දී විදුලිය ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) 2012 වර්ෂය තුළදී නැගෙනහිර පළාතේ විදුලිය නොමැති සියලුම ගම්මානවලට විදුලිය ලබා දීමේ හැකියාවක් තිබුණේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3148/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009, 2010, 2011, 2012 සහ 2013 යන වර්ෂවල දී ලබාගෙන ඇති ශුද්ධ ණය ප්‍රමාණයන් කවරේද;

(ii) ශුද්ධ සංචිත විශාල වශයෙන් වැඩිවෙමින් පවතින බවට රජය විසින් සිදු කරනු ලබන ප්‍රකාශයට අනුව ඉහත කී වර්ෂ තුළදී සංචිත වැඩි වී ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා සංචිතවලට ඇතුළත් කරන ලද දිගු කාලීන ණය ප්‍රමාණය කොපමණද;

(ii) පසුගිය වර්ෂ තුන තුළ එක් එක් වර්ෂයේදී ආනයනයේ ප්‍රතිශතයක් වශයෙන් සංචිත ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) සංචිතවල තත්ත්වය ප්‍රකාශ කරනු ලබන තරමට ධනාත්මක නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3217/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුඹුරු ඉඩම් හිමියන් හා අඳ ගොවීන් අතර ඇතිවන ආරවුල් විසඳනු ලබන්නේ ගොවි ජන විනිශ්චය සභාවෙන් බවත්;

(ii) වර්ෂ 12 ක පමණ කාලයක සිට එම ආයතනය පිහිටුවා නොමැති බවත්;

(iii) එම නිසා මෙම ක්ෂේත්‍රයේ ඇතිවන ගැටලු දිස්ත්‍රික් කාර්යාලවල ගොඩගැසී ඇති බවත්;

(iv) එම තත්ත්වය යටතේ කුඹුරු ඉඩම් හිමියන් සහ අඳ ගොවීන් ගැටලු රැසකට මුහුණපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කඩිනමින් ගොවි ජන විනිශ්චය සභාව පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3369/'12

ගරු පී. හැරිසන් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයස අවුරුදු 2-5 අතර දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමට රජය සැලසුම්කර තිබේද;

(ii) ඒ අනුව මේ වන විට නැවුම් කිරි වීදුරුවක් ලබාගැනීම සඳහා සුදුසුකම් ඇති ළමයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ වෙනුවෙන් 2013 අයවැයෙන් වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) ඒ අනුව එක් ළමයෙකුට නැවුම් කිරි ලබාදීම සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වන විට ලියාපදිංචි කර ඇති පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2013 වර්ෂයේදී පෙර පාසල්වල අධ්‍යාපනය ලැබූ දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ශ්‍රී ලංකාවට අවශ්‍යව ඇති පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3615/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු පයාගල පිහිටි ඊරියගම ප්‍රදේශය අයත් වන ග්‍රාම නිලධාරි වසම කවරේද;

(ii) එම ගම්මානයේ ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් ජීවත්වන ඉඩම් හා නිවාස වෙනුවෙන් ඔප්පු ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගම්මානයට පොදු ප්‍රවාහන පහසුකම් හා විදුලි බලය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් පහසුකම ලබා දුන් දිනයන් කවරේද;

(iii) ලබා දී ඇති ප්‍රවාහන පහසුකමෙහි ගමනාරම්භය හා ගමනාන්තය කවරේද;

(iv) ඊරියගම ප්‍රදේශය අයත් ග්‍රාම නිලධාරී වසම තුළ "මග නැගුම" හා "ගම නැගුම" ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4153/'13

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 වර්ෂයේ දී පාසල් නිල ඇඳුම් සඳහා චීනයෙන් ආනයනය කරනු ලැබූ රෙදි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම රෙදි ආනයනය කරනු ලැබූ සමාගම කවරේද;

(iv) එම සමාගම හරහා ඉහත නිල ඇඳුම් රෙදි ආනයනය කිරීමේ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය සඳහා නිල ඇඳුම් සැපයීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් හා මිල ගණන් කවරේද;

(ii) ඉහත සමාගම් අතරින් තෝරා ගනු ලැබුවේ අඩුම ලංසුව ඉදිරිපත් කරන ලද සමාගමද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) අඩුම ලංසුව ඉදිරිපත් කළ සමාගම විසින් ඉදිරිපත් කළ රෙදිවල තිබූ අඩු පාඩු කවරේද;

(v) තෝරාගත් සමාගම ඉදිරිපත් කළ නිල ඇඳුම් රෙදිවලද ඉහත අඩු පාඩු මෙන්ම තවත් අඩු පාඩුද තිබූ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4325/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පාතකඩ, උඩුවර සහ දෙල්ගොඩ යන ප්‍රදේශවල පවත්වාගෙන යනු ලබන ගල්කොරි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගල්කොරිවල නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් ආයතනය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරවල ස්වභාවයන් කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අනුමතිය සහ බලපත්‍ර ලබාගෙන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් බලපත්‍රය සහ අනුමතිය ලබාගෙන ඇති දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රදේශයේ පවතින බරපතල පරිසර දූෂණයක් පිළිබඳව වාර්තාවී තිබේද;

(ii) එසේ නම්, එකී පරිසර දූෂණ තත්ත්වය වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4428/'13

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.09.24 දිනැති අංක 1620/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය පරිදි රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ, අන්තර්කාලීන විධිවිධාන යටතේ සේවයේ නියුතු පුස්තකාලයාධිපතිවරුන් හට පෙරදාතම් කර අදාළ පන්ති සඳහා ලබා දිය යුතු උසස්වීම් මෙතෙක් නිසියාකාරව ලබා දී නොමැති බවත්;

(ii) දැනට රජයේ පුස්තකාලයාධිපති සේවයේ බඳවා ගැනීම් පන්තිය වන III පන්තියේ පුරප්පාඩු රාශියක් පවත්නා බවත්;

(iii) පෙර කී සේවා ව්‍යවස්ථාව තුළ හඳුනාගෙන ඇති සේවක සංඛ්‍යාවෙන් 70%කට වැඩි ප්‍රමාණයක් මේ දක්වා ද පුරප්පාඩුව පවත්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1981 වර්ෂයේ සිට පෙර කී පුස්තකාලයාධිපති සේවයේ අධි / විශේෂ පන්තියේ වැටුප් පරිමාණය දීප ව්‍යාප්ත සේවාවල II / II පන්තියේ වැටුප් පරිමාණයට ඉහළින් පැවති බවත්;

(ii) අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් පුස්තකාලයාධිපති සේවයේ විශේෂ පන්තිය පෙර කී දීප ව්‍යාප්ත සේවා පිහිටුවන ලද වැටුප් පරිමාණයට බොහෝ පහළින් වූ MN - 07 වැටුප් පරිමාණය මත පිහිටුවා ඇති බවත්;

(iii) එමගින් පුස්තකාලයාධිපති විශේෂ පන්තියට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) එම පියවර ක්‍රියාත්මක කරනු ලබන්නේ කෙදිනක සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4440/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැයට කිරුළ 2014 සංවර්ධන වැඩසටහන යටතේ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය වෙත ලබාදුන් පහසුකම් කවරේද;

(ii) එකී පහසුකම් ලබාදීම වෙනුවෙන් වැය කරන ලද ප්‍රතිපාදනවල වටිනාකම කොපමණද;

(iii) එම ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද නවීකරන කටයුතු සහ පහසුකම් ලබාදීමේ කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර අවසන් කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4555/'13

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරයට සුදුස්සෙකු පත් නොකර වර්ෂ 2ක පමණ කාලයක් එම පුරප්පාඩුව තබාගෙන සිටීමට හේතුව කවරේද;

(ii) එම තනතුරේ වැඩ බැලීම සඳහා මේ වන විට පත් කර සිටින නිලධාරියා පරිපාලන ශ්‍රේණියේ අයෙකුද;

(iii) මේ වන විට ඔහු නියමිත පටිපාටියට අනුව බඳවා ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2585/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ එක් පවුලකට මාසයක් ජීවත්වීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එක් පවුලකට එක් මාසයකදී ආහාර සඳහා සහ ආහාර නොවන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් පවුලකට ජීවත්වීම සඳහා මාසිකව අවශ්‍ය මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සාමාජිකයින් තුන් දෙනෙකු සහිත පවුලකට මාසයක් ජීවත්වීම සඳහා රු.7500.00 ක මුදලක් ප්‍රමාණවත් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3150/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 ජනවාරි 1 වැනි දින සිට අද දක්වා ශ්‍රී ලංකාවට චීනයෙන් ලැබී ඇති ආධාර, සහනදායී ණය හා ප්‍රදාන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එකී අරමුදල් ලබා දුන්, සියල්ල ඇතුළත් වැඩිම සහ අඩුම පොලී පිරිවැය වසරක් සඳහා කොපමණද;

(iii) එක් එක් අරමුදල් සැපයුමේ ආපසු ගෙවීමේ කාල සීමාව කවරේද;

(iv) අරමුදල් යොදාගත් එක් එක් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආදායම් කවරේද;

(v) ණය ලබා දුන් දිනයේ සිට වර්ෂ 5ක් සඳහා එක් එක් ණයෙහි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3418/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම හා පහළ මධ්‍යම පන්තියේ ජනතාවගෙන් බහුතරයක් ප්‍රවාහන කටයුතු සඳහා ත්‍රිරෝද රථ හා යතුරුපැදි භාවිත කරන බවත්;

(ii) මෙම රථ හා බැඳුණු සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් බිහිවී ඇති බවත්;

(iii) ත්‍රිරෝද රථ, යතුරුපැදි සහ ඒවායේ අමතර කොටස්වල මිල අධිකවීම එම රැකියා අඩපණවීමට හේතුවිය හැකි බවත්;

(iv) ත්‍රිරෝද රථ හා යතුරුපැදි සඳහා දැනට අයකරනු ලබන අධික බදු ඒවායේ මිල ඉහළ යාමට හේතු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආනයනය කිරීමෙන් පසු 2005 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව තුළදී අයකරනු ලබන බදු මුදල් හා වෙනත් අයකිරීම් ප්‍රමාණයන් ප්‍රතිශත වශයෙන්, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(ii) ත්‍රිරෝද රථ හා යතුරුපැදි සඳහා බදු සහන ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3429/'13

ගරු පී. හැරිසන් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ නගරයේ පවතින වාහන තදබදය අවම කිරීම සඳහා බහාලුම් ඇතුළු බරවාහන නගරය ඇතුළත ගමන් කිරීමේ කාලය වර්ෂ 2007-2009 අතර කාල සීමාව තුළදී සීමාවන්ට යටත් කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) බහාලුම් ඇතුළු බර වාහන ගමන් කිරීමේ කාලය සීමා කිරීමේ එම ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා මුල්වූ ආයතනයන් කවරේද;

(ii) එවකට නගරය තුළ බර වාහන ධාවනය සීමා කර තිබූ කාල වේලාවන් කවරේද;

(iii) මේ වන විට එම ක්‍රියාමාර්ගය අවලංගු කර තිබේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) කොළඹ නගරය තුළ වාහන තදබදය වැඩිවීමට හේතුවන බහාලුම් ඇතුළු බර වාහන ධාවන කාල සීමාවන් සීමා කිරීම නැවත ඇති කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4556/'13

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂය සඳහා අවශ්‍ය ඇතැම් ඖෂධ වර්ග ගෙන්වීම සඳහා මේ වන විට ටෙන්ඩර්කරුවන් තෝරා ගෙන තිබේද;

(ii) එම එක් ඖෂධයක් ගෙන්වීම සඳහා ටෙන්ඩර්කරුවන් කීප දෙනෙක් ඉදිරිපත් වූ අවස්ථාවකදී සුදුසු ටෙන්ඩර්කරුවා තෝරා ගැනීමට ගත වන කාල සීමාව කවරේද;

(iii) එම හේතුව නිසා 2014 වර්ෂයේදී රෝහල්වල ඖෂධ හිඟයක් ඇතිවීමේ අවදානමක් පවතින්නේද;

(iv) 2013 වර්ෂය සඳහා ඇණවුම් කළ ඖෂධවලින් ලැබී ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?